# ඇමති විමල් වීරවංසගේ විරෝධය පුස්සක්!

වාමාංශික පෙරමුණ

ඇමති විමල් වීරවංශ එක්සත් ජාතින්ගේ කාර්යාලය වටලමින්, බැන් කී මූන් විසින් ශ්‍රී ලංකාවේ යුද අපරාධ සොයාබැලීම සඳහා පත්කළ කමිටුවට එරෙහිව දියත් කළ විරෝධය, මහින්ද ආණ්ඩුව විසින්ම නිර්මානය කළ පුහු විරෝධයක් බව වාමාංශික විමුක්ති පෙරමුණ පුවත්පත් නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කර සිටී.

පුවත්පත් නිවේදනය සම්පූර්ණයෙන් මෙසේය.

සාමය ආරක්ෂා කිරීම වෙනුවෙන් පොලිස්පතිවරයාගේ නිර්දේශය මත එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා කාර්යාලය වෙත පැමිණි පොලිස් නිළධාරීන් ට එම සථානයෙන් ඉවත්වීමට ආරක්ෂක ලේකම්වරයා නියෝග කිරීමෙන් එය වඩාත් තහවුරු වේ.

අමෙරිකාව, යුරෝපය ප්‍රමුඛ ගෝලීය බලවතුන් හා එහි සෘජු ඒජන්තයෙකු වන ඉන්දියාවේ උපදෙස් අකුරටම ක්‍රියාත්මක කරන මහින්ද ආණ්ඩුව, එම ගෝලීය බලවතුන්ගේ ම සුවච කීකරු ගෝලයෙකු වන බැන් කී මූන් ට එරෙහිව විරෝධය පෑම පුස්සක් වන්නේ ඒ අර්ථයෙන්ය. එසේම විමල් වීරවංශගේ පුහු විරෝධය ඔහු විසින් මෙහෙයවන ලද මානෙල් මල් ව්‍යාපාරය හරහා  මේ චෝදනා කරන යුද අපරාධ සම්බන්ධයෙන් ඔහුගේ භූමිකාවක් වීදැයි යන සැකය මතු වේ.

මෙවැනි පසුබිමක් තුළ මේ ආණ්ඩුවේ පුහු විරෝධය සම්බන්ධයෙන් බැන් කී මූන් ප්‍රමුඛ ගෝලීය බලවතුන් අනුගමනය කරන්නේ කුමන පිළිවෙතක් ද යන්න පිළිබඳව වාමාංශික විමුක්ති පෙරමුණ විමසිල්ලෙන් සිටී.

හියුගෝ චාවේස්, කියුබාවේ කැස්ත්‍රෝ මෙන් අමෙරිකාව ප්‍රමුඛ ගෝලීය බලවතුන් සමඟ හැපෙන්නට ආණ්ඩුවට අවශ්‍යතාවයක් තිබේ නම්, ආණ්ඩුව කළයුත්තේ සත්‍ය වශයෙන්ම සිදුවී ඇතැයි කියන යුද අපරාධයන් සම්බන්ධයෙන් දෙමළ ජාතියෙන් සමාව ගෙන, ඔවුනට යුක්තිය ඉටුකරමින් ගෝලීය බලවතුන්ගේ අපරාධයන්ට එරෙහිව ශ්‍රී ලාංකික ජනතාව පෙළගැස්සවීම බව ප්‍රකාශ කරමු.

එසේ නොවන්නේ නම් විමල් වීරවංශගේ විරෝධය පුස්සක් වනවා සේම මෙම ආණ්ඩුව ලෝකය ඉදිරියේ කවයටන්ගේ ආණ්ඩුවක් බවට පත්වීම හැර අන් ප්‍රතිඵලයක් අත් නොවන බව වැඩිදුරටත් ප්‍රකාශ කර සිටිමු.

මෙයට,

ධර්මසිරි ලංකාපේලි
ප්‍රචාරක ලේකම්.